සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2023 ජනවාරි

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2023-03-04
පෙරවරු
[09.00 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ගිණුම්කරණ නිමැවුමක් වන්නේ කුමක් ද?

(1) ලෙජර් ගිණුම.   (2) ශේෂ පිරික්සුම.

(3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.   (4) විකුණුම් ජර්නලය.

**1.2** අස්තිත්වයක් විසින් අනුගමනය කරනුලබන තොග ගණනය කිරීමේ ක්‍රමයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය කාලච්ඡේද අතරතුරදී වෙනස් නොකළ යුතුය. මේ සම්බන්ධයෙන් වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) උපචිත සංකල්පයයි.   (2) අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පයයි.

(3) ඓතිහාසික පිරිවැය සංකල්පයයි.   (4) සංගතතා සංකල්පයයි.

**1.3** **ඇන් ට්‍රේඩර්ස්** 2020 අප්‍රේල් 01 දින රු.5,000,000/- කට මෝටර් රථයක් අත්පත් කර ගත් අතර, ව්‍යාපාරය විසින් වාර්ෂිකව 25% ක අනුපාතයක් යටතේ හීනවන ශේෂ ක්‍රමයට මෝටර් වාහන ක්ෂය කරනු ලබයි. 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ක්ෂය අයකිරීම වූයේ:

(1) රු.1,250,000/-.   (2) රු.937,500/-.   (3) රු.703,125/-.   (4) රු.900,000/-.

**1.4** කේවලස්වාමි ව්‍යාපාරයක් වන **ජෝවන් ට්‍රේඩර්ස්,** පිරිවැය රු.750,000/- ක් වූ භාණ්ඩ රු.1,000,000/- කට ණයට විකුණන ලදී. මෙම ගනුදෙනුව සම්බන්ධයෙන්, ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම පහත සඳහන් ඒවා අතුරින් තෝරන්න:

| | වත්කම් (රු.) | = | ප්‍රාග්ධනය (හිමිකම) (රු.) | + වගකීම් (රු.) |
|---|---|---|---|---|
| (1) | -1,000,000 | = | - | -1,000,000 |
| (2) | +250,000 | = | +250,000 | - |
| (3) | +1,000,000 | = | +250,000 | +750,000 |
| (4) | +750,000 | = | - | +750,000 |

**1.5** **සැම් ට්‍රේඩර්ස්** හි 2022 මාර්තු 31 වන දිනට බැංකු ප්‍රකාශනයේ වාසිදායක ශේෂය රු.375,000/- ක් වූ අතර, මෙම ශේෂය මුදල් පොතේ ශේෂයෙන් වෙනස් විය. 2022 මාර්තු 31 දිනට ඉදිරිපත් නොකළ චෙක්පත් හා උපලබ්ධි නොවූ චෙක්පත් පිළිවෙලින් රු.15,000/- ක් හා රු.24,000/- ක් විය.

ඉහත සඳහන් තොරතුරු පදනම් කර ගනිමින්, 2022 මාර්තු 31 දිනට **සැම් ට්‍රේඩර්ස්** හි පොත්වල පෙන්නුම් කළ මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) ශේෂය වූයේ:

(1) රු.366,000/-. (2) රු.336,000/-. (3) රු.414,000/-. (4) රු.384,000/-.

**1.6** පහත සඳහන් ලෙජර් ගිණුම් අතුරෙන්, ජංගම වත්කමක් ලෙස වර්ග කළ හැක්කේ කුමක් ද?

(1) විකුණුම් ගිණුම. (2) කලින් ගෙවීම් ගිණුම.

(3) බැංකු ණය ගිණුම. (4) ප්‍රාග්ධන ගිණුම.

**1.7** **විරාත්,** ඔහුගේ ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශීර්ෂයේ **"2022 මාර්තු 31 දිනට"** ලෙස සඳහන් කර තිබුණි. ඔහු විසින් අනුගමනය කර තිබෙන වඩාත්ම අදාළ ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) කාලච්ඡේද සංකල්පය. (2) ප්‍රමාණාත්මක සංකල්පය.

(3) ගැළපුම් සංකල්පය. (4) උපචිත සංකල්පය.

**1.8** පහත සඳහන් මූලාශ්‍ර ලියවිලි අතුරෙන්, සැපයුම්කරුවන්ගෙන් ලැබුණු භාණ්ඩ වාර්තා කිරීමට ගබඩා භාරකරු විසින් භාවිත කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ කුමක් ද?

(1) විකුණුම් ඉන්වොයිසිය.

(2) භාණ්ඩ ලැබීමේ පත්‍රය [Goods Received Note (GRN)].

(3) ගැනුම් ඇණවුම [Purchase Order (PO)].

(4) ගෙවීම් වවුචරය.

**1.9** පහත සඳහන් තොරතුරු, කේවලස්වාමි ව්‍යාපාරයක් වන **මානෙල් ස්ටෝස්** හි 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පොත්වලින් උපුටා ගන්නා ලදී:

| | **රු.** |
|---|---:|
| 2022 මාර්තු 31 වන දිනට මුළු වත්කම් | 7,500,000 |
| 2021 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 5,000,000 |
| වර්ෂය තුළදී සිදුකළ ගැනිලි | 600,000 |
| 2022 මාර්තු 31 දිනට වගකීම් | 1,700,000 |

ඉහත සඳහන් තොරතුරු පදනම් කරගනිමින්, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය වූයේ:

(1) රු.1,400,000/-. (2) රු.200,000/-. (3) රු.1,900,000/-. (4) රු.600,000/-.

**1.10** **ඉසංකා,** ඇගේ ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා ලබාගත් බැංකු ණය මුදලේ ප්‍රාග්ධනය ආපසු ගෙවීම වශයෙන් රු.1,750,000/- ක් ගෙවන ලදී. ඇගේ ව්‍යාපාරයේ ලෙජර් ගිණුම්වල මෙම ගනුදෙනුව වාර්තා කිරීමේ නිවැරදි ආකාරය වන්නේ:

(1) බැංකු ගිණුම හර සහ බැංකු ණය ගිණුම බැර. (2) බැංකු ණය ගිණුම හර සහ බැංකු ගිණුම බැර.

(3) බැංකු ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර. (4) බැංකු ණය ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර.

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** ආරක්ෂණ සංකල්පය (prudence concept) අනුව, ව්‍යාපාරය සහ අයිතිකරුවන් වෙන්වූ ස්වාධීන අස්තිත්වයන් දෙකක් ලෙස සලකා ගනුදෙනු හඳුනාගනු ලබයි.

**1.12** අත්පිට මුදලට සිදුකරන දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනුම් සහ විකුණුම්, පොදු ජර්නලයේ වාර්තා කරයි.

**1.13** ගැනුම් ගිණුම, නාමමාත්‍ර ගිණුම් සඳහා උදාහරණයකි.

**1.14** නිශ්චිත කාලපරිච්ඡේදයක් ආරම්භයේදී එම කාල පරිච්ඡේදයේ වියදම් දැරීම සඳහා ප්‍රධාන අයකැමි විසින් සුළු මුදල් අයකැමිට ලබාදෙන මුදල් ප්‍රමාණය, සුළු මුදල් අග්‍රිමය ලෙස හැඳින්වේ.

**1.15** වගකීම් ගිණුමක සාමාන්‍යයෙන් හර ශේෂයක් පවතී.

*අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** "ස්කන්ධය (හිමිකම)" යන පදය නිර්වචනය කරන්න.

**1.17** "මූල්‍ය ගිණුම්කරණය" සහ "කළමනාකරණ ගිණුම්කරණය" අතර වෙනස්කම් දෙකක්(02) හඳුනා දක්වන්න.

**1.18** "ව්‍යාපාර ආචාරධර්ම" යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.19** "විශේෂිත ගිණුම්කරණ මෘදුකාංග" සඳහා උදාහරණ දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.20** මූලික සටහන් පොත් පවත්වාගෙන යාමේ වැදගත්කම් / අරමුණු දෙකක්(02) හඳුනා දක්වන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

**අතීෂ් ට්‍රේඩර්ස්** යනු 2021 අප්‍රේල් 01 දින රු.5,000,000/- ක් මුදලින් ආයෝජනය කරමින් **අතීෂ්** විසින් ආරම්භ කරන ලද කේවලස්වාමි ව්‍යාපාරයකි.

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා තිබේ:

(1) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) සාරාංශය පහත දැක්වේ:

**මුදල් පාලන ගිණුම (මුදල් පොත)**

| ලැබීම් | හර (රු.) | ගෙවීම් | බැර (රු.) |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 5,000,000 | අත්පිට ගැනුම් | 2,100,000 |
| අත්පිට විකුණුම් | 3,200,000 | වෙළෙඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 2,150,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,400,000 | වැටුප් හා වේතන | 1,300,000 |
| | | කාර්යාල කුලිය | 600,000 |
| | | යන්ත්‍රයක් මිලට ගැනීම<br>(2022 ජනවාරි 01 දින මිලට ගන්නා ලද) | 3,000,000 |
| | | විදුලිය | 100,000 |
| | | ශේෂය ප/ගෙ | 350,000 |
| | **9,600,000** | | **9,600,000** |
| ශේෂය ඉ/ගෙ | 350,000 | | |

(2) 2022 මාර්තු 31 දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් පහත පරිදි වේ:

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 1,950,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 740,000 |
| කලින් ගෙවූ කාර්යාල කුලිය | 100,000 |
| ගෙවිය යුතු විදුලි බිල්පත | 25,000 |

(3) යන්ත්‍ර, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 25% බැගින් ක්ෂය කළ යුතු වේ.

(4) 2022 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු 31 දිනට, **අතීෂ් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**කළුවර ෆර්නිචර්ස්,** කෑම මේස සහ පුටු නිෂ්පාදකයෙකු වන අතර, පහත සඳහන් තොරතුරු 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **කළුවර ෆර්නිචර්ස්** හි පොත්වලින් උපුටාගන්නා ලදි:

| **විස්තරය** | **රු.** |
|---|---:|
| 2021 අප්‍රේල් 01 දිනට අමුද්‍රව්‍ය තොගය | 600,000 |
| අමුද්‍රව්‍ය ගැනුම් | 4,700,000 |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | 185,000 |
| 2021 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ | නොමැත |
| කම්හල් කළමනාකරුගේ වැටුප | 680,000 |
| සෘජු වේතන | 600,000 |
| කුලී | 800,000 |
| කම්හල් ගොඩනැගිල්ලේ රක්ෂණය | 200,000 |
| විදුලිය | 720,000 |
| ජලය | 300,000 |
| පිරියත සහ යන්ත්‍ර මත ක්ෂය | 350,000 |
| කම්හල් ගොඩනැගිල්ල මත ක්ෂය | 600,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2022 මාර්තු 31 දිනට අවසාන තොග ශේෂයන් පහත පරිදි අගය කර තිබේ:

| **විස්තරය** | **රු.** |
|---|---:|
| අමුද්‍රව්‍ය තොගය - පිරිවැයට | 650,000 |
| නොනිමි වැඩ (මුළු නිෂ්පාදන පිරිවැයට අගය කළ) | 250,000 |

(2) පහත දැක්වෙන වියදම්, පහත සඳහන් පරිදි බෙදා වෙන්කළ යුතුය:

| **වියදම** | **කම්හල** | **කාර්යාලය** |
|---|:---:|:---:|
| විදුලිය | 75% | 25% |
| ජලය | 40% | 60% |
| කුලී | 60% | 40% |

(3) නිෂ්පාදනය කරන ලද ගෘහ භාණ්ඩ, නිෂ්පාදන පිරිවැය මත 25% ක ලාභ ආන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **කළුවර ෆර්නිචර්ස්** හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

(A) කේවලස්වාමි ව්‍යාපාරයක ගනුදෙනු පහක් (5) මගින් ගිණුම්කරණ සමීකරණයට සිදුවන බලපෑම ඔබ වෙත පහත දී තිබේ:

| | වත්කම් | | | | | | | = | ස්කන්ධය (ප්‍රාග්ධනය) | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | + | තොග | + | වෙළෙඳ ණයගැතියෝ | + | මුදල් | = | | + | වෙළෙඳ ණයහිමියෝ |
| (1) | | | | | | | + 2,000,000 | = | + 2,000,000 | | |
| (2) | + 750,000 | | | | | | (150,000) | = | | | + 600,000 |
| (3) | | | + 300,000 | | | | | = | | | + 300,000 |
| (4) | | | | | | | (450,000) | = | | | (450,000) |
| (5) | | | (145,000) | | + 180,000 | | | = | + 35,000 | | |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ගිණුම්කරණ සමීකරණයේ (1) සිට (5) දක්වා ඇති එක් එක් අයිතමය සඳහා සිදුවිය හැකි ගනුදෙනුව **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

(B) 2022 මාර්තු 31 දිනට, **නුවන් ට්‍රේඩර්ස්** හි බැංකු ප්‍රකාශනයේ රු.195,000/- ක වාසිදායක ශේෂයක් පෙන්වූ අතර, එදිනට එහි මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) රු.250,000/- ක හර ශේෂයක් පෙන්වීය. **නුවන් ට්‍රේඩර්ස්** හි ගණකාධිකාරිවරයා වෙනස සඳහා පහත සඳහන් හේතු සටහන් කරන ලදි.

(1) ස්ථාවර නියෝග අනුව, බැංකුව විසින් රු.50,000/- ක රක්ෂණ වාරිකය හර කර තිබෙන නමුත් එය මුදල් පොතේ සටහන් කර නොමැත.

(2) රු.120,000/- ක චෙක්පතක් බැංකුවේ තැන්පත් කර ඇති නමුත් 2022 මාර්තු 31 දින වන විටත් එය උපලබ්ධි වී නොමැත.

(3) ගනුදෙනුකරුවෙකු විසින් බැංකු ගිණුමට රු.38,000/- ක ඍජු තැන්පතුවක් සිදුකළ අතර, එය මුදල් පොතේ වාර්තාකර නොමැත.

(4) 2022 මාර්තු මාසය සඳහා වන රු.500/- ක බැංකු ගාස්තු, මුදල් පොතේ සටහන් කර නොමැත.

(5) බැංකුව විසින් වැරදීමකින් රු.2,500/- ක් **නුවන් ට්‍රේඩර්ස්** හි බැංකු ගිණුමට බැර කර තිබේ.

(6) 2022 මාර්තු 29 දින **නුවන් ට්‍රේඩර්ස්** විසින් නිකුත් කරන ලද රු.75,000/- ක චෙක්පතක් 2022 මාර්තු 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙළ කරන්න**:

(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 02)

(b) 2022 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

(A) **රන්වත් ට්‍රේඩර්ස්** යනු තොග වෙළෙඳ ව්‍යාපාරයකි. සහකාර ගණකාධිකාරීවරයා විසින් 2022 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවීය. වෙනස වූ රු.139,000/- අවිනිශ්චිත ගිණුමකට හර කර, කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. **රන්වත් ට්‍රේඩර්ස්,** වෙළෙඳ ලැබිය යුතු මුදල් හා වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම් පවත්වාගෙන යයි.

පහත සඳහන් වැරදි පසුව හඳුනා ගන්නා ලදී:

(1) දෛනික විකුණුම් පොතේ එකතුව රු.135,000/- ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(2) පිරිවැය රු.117,000/- ක් වූ කාර්යාල උපකරණ, සීමාසහිත **AT කුරේ සමාගමෙන්** ණයට මිලට ගැනීම ලෙජර් ගිණුම් දෙකේම දෙවරක් සටහන් කර තිබුණි.

(3) 2022 මාර්තු මාසය සඳහා රු.65,000/- ක කුලී වියදම, කුලී ආදායම් ගිණුමට බැර කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තාකොට තිබුණි.

(4) රු.65,000/- ක දුරකතන වියදම්, මුදල් ගිණුමේ නිවැරදිව වාර්තා කොට තිබුණද, දුරකතන වියදම් ගිණුමට එය රු.56,000/- ක් ලෙස හර කර තිබුණි.

(5) රු.220,000/- ක් පිරිවැය වූ ගෘහ භාණ්ඩ මිලට ගැනීම, අලුත්වැඩියා සහ නඩත්තු ගිණුමට හර කර තිබූ අතර, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කොට තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් (ලකුණු 05)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 02)

(B) **ශක්ති ට්‍රේඩර්ස්** හි 2022 අප්‍රේල් මාසය සඳහා පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත:

| **විස්තරය** | **පිරිවැය (රු.)** |
|---|---|
| 2022 අප්‍රේල් 01 දිනට, වෙළෙඳ ලැබිය යුතු මුදල් (ණයගැති) ශේෂය | 5,500,000 |
| මාසය සඳහා දෛනික විකුණුම් පොතේ එකතුව | 3,650,000 |
| මාසය සඳහා අත්පිට විකුණුම් | 2,350,000 |
| මාසය සඳහා දෛනික විකුණුම් ආපසු එවුම් පොතේ එකතුව | 500,000 |
| මාසය තුළදී වෙළෙඳ ලැබිය යුතු ගිණුම්වලින් මුදල් ලැබීම් | 1,800,000 |
| මාසය තුළදී ලියා හළ බොල් ණය | 10,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 අප්‍රේල් මාසය සඳහා වෙළෙඳ ලැබිය යුතු මුදල් පාලන ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 03)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**අමල් ට්‍රේඩර්ස්, අමල්ට** හිමි කේවලස්වාමි ව්‍යාපාරයකි. 2022 මාර්තු 31 දිනට **අමල් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත දැක්වේ:

**අමල් ට්‍රේඩර්ස්**

**2022 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| යන්ත්‍ර | 3,000 | |
| පරිගණක | 1,800 | |
| 2021 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| යන්ත්‍ර | | 1,500 |
| පරිගණක | | 450 |
| විකුණුම් | | 252,000 |
| ගැනුම් | 177,000 | |
| ගැනුම් මත ආනයන තීරු බදු | 1,500 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 20,200 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 6,000 |
| අතැති හා බැංකුවේ මුදල් | 85 | |
| 2021 අප්‍රේල් 01 දිනට තොගය | 12,150 | |
| ජලය | 150 | |
| විදුලිය | 3,450 | |
| වැටුප් සහ වේතන | 45,000 | |
| කාර්යාල කුලිය | 6,000 | |
| ප්‍රවාහන වියදම් | 4,800 | |
| ගෙවූ බැංකු ණය පොලිය | 1,200 | |
| දුරකතන සහ අන්තර්ජාල ගාස්තු | 500 | |
| 2021 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 11,385 |
| බැංකු ණය | | 5,500 |
| **එකතුව** | **276,835** | **276,835** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2022 මාර්තු 31 දිනට අවසාන තොගය රු.7,750,000/- ක පිරිවැයකට අගය කරන ලදී.

(2) 2022 ජනවාරි 01 දින, **අමල්ට** අයත්ව තිබූ රු.2,000,000/- ක් වටිනා බෙදාහැරීමේ වෑන් රථයක්, ව්‍යාපාරයට මාරු කරන ලද අතර, එය **අමල් ට්‍රේඩර්ස්** හි ගිණුම් පොත්වල වාර්තා කර නොතිබුණි.

(3) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත සඳහන් පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| යන්ත්‍ර | : | වර්ෂයකට 20% බැගින් |
| පරිගණක | : | වර්ෂයකට 25% බැගින් |
| මෝටර් වාහන | : | වර්ෂයකට 25% බැගින් |

(4) 2022 මාර්තු මාසය සඳහා රු.75,000/- ක් වූ විදුලි බිල්පත හා රු.22,000/- ක් වූ ජල් බිල්පත, 2022 මාර්තු 31 දින වන විට ගෙවා නොතිබුණි.

(5) ආර්ථික අවපාතය නිසා, ගනුදෙනුකරුවෙක් බුන්වත්භාවය ප්‍රකාශයට පත් කළ අතර, ඔහුගෙන් ලැබිය යුතුව තිබූ රු.75,000/- ක ශේෂය බොල්ණය ලෙස කපා හැරීමට **අමල්** තීරණය කරන ලදී.

(6) 2022 මාර්තු මාසය සඳහා බැංකු ණය පොලිය රු.100,000/- ක් වූ අතර, එය 2022 අප්‍රේල් මාසයේදී ගෙවන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන ඇ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |